**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙහිඕවිට අධ්‍යාපන කලාපය.**

# මව්බස විෂය සමගාමී ක්‍රියාකාරකම්

**සැකසුම : කේ. ජී අශෝකා මැණිකේ (ගුරු උපදේශක)**

---

**1 ශ්‍රේණිය**

## ක්‍රියාකාරකම - 1

### පියවර 1 (වැඩිහිටි අයකුගේ උදවු අවශ්‍යය )

- පොළොවේ ඕනෑම තැනකින් පස් බාල්දියක් පමණ ගන්න ( මැටි සහිත පසක් නම් වඩාත් හොඳයි).
- පස් වතුරෙන් දිය කරගන්න.
- ගෝනි කැබැල්ලක් හෝ කුඩාම සිදුරු සහිත දැලකින් භාජනයකට පෙරා ගන්න.
- මැටි තට්ටුව භාජනයේ අඩියට මිදෙන්න තබන්න ( පැය 4/5 ).
- වතුර පෙරන්න, මැටි තරමක් වේලා ගන්න.
- පොල්තෙල් මිශ්‍ර කරමින් දරුවා සමඟ මැටි අනන්න.
- මැටි අතේ නොගෑවෙන තෙක් අනන්න.

### පියවර 2

- කුඩා මැටි බෝල සෑදීමට යොමු කරන්න.(දරුවා කළ යුතුය)
- එක් එක් මැටි බෝලය ගෙන හරි මැදින් ඉරටුවක් ගසන්න



- තරමක් වේලෙනවිට ඉරටුව සෙමෙන් ගැලවීමට යොමු කරන්න.
- මැටි බෝල හොඳින් වේලන්න ( හැකි නම් පාට කරන්න).
- නූලකින් මාලයක් අමුනන්න ( උදවු කරන්න).
- පාසලේ පැවැත්වෙන නිර්මාණ ප්‍රදර්ශනයට තැබීමට රැගෙන යාමට ප්‍රවේසම් කර තබාගන්න.